## සේවායෝජකගේ වාර්ෂික ප්‍රකාශය
## (අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද - APIT)
## තක්සේරු වර්ෂය 2023/2024

**2024 අප්‍රේල් මස 30 වන දින හෝ එදිනට පෙර**

**APIT වාර්ෂික ප්‍රකාශය සහ උපලේඛන ගොනුකිරීම සඳහා**

# ඊ-සේවාව විවෘතව ඇත

**ඉලෙක්ට්‍රොනිකව ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.**

- ඊ-සේවාව මගින් ගොනු කිරීම සඳහා පෞද්ගලික හැඳුනුම් අංකයක් (PIN) තිබිය යුතුය. බදු ගෙවන්නකුට PIN අංකයක් නොමැති නම්, ඔහුට / ඇයට
  - ඊ-සේවාව මගින් හෝ
    www.ird.gov.lk ⟶ ඊ-සේවාවන් වෙත පිවිසීම ⟶ PIN අංකයක් සඳහා ඉල්ලීම
  - ප්‍රධාන කාර්යාලයේ ප්‍රාථමික ලියාපදිංචි අංශයෙන් (2වන මහල) හෝ ඕනෑම නගර/ප්‍රාදේශීය කාර්යාලයකින්

  PIN අංකයක් ලබාගන්නා ලෙස දැනුම් දෙනු ලැබේ.

- වාර්ෂික ප්‍රකාශය ගොනු කිරීමට පෙර පහත සඳහන් උපදෙස් හා මාර්ගෝපදේශය බලන්න
  - *සේවායෝජකගේ වාර්ෂික ප්‍රකාශය සහ උපලේඛන සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්*
  - *APIT ප්‍රකාශය ඊ-සේවාව මගින් ඉදිරිපත් කිරීමටමාර්ගෝපදේශය*
  - *APIT උපලේඛන සකස් කිරීම සඳහා මාර්ගෝපදේශය*

  www.ird.gov.lk ⟶ බාගතකරගැනීම් ⟶ ආකෘති පත්‍ර සහ වාර්තා ⟶ වාර්තා ⟶ අනෙකුත් බදු වාර්තා ⟶ උපයන විට ගෙවීමේ බද්ද (PAYE) / අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (APIT)

- *APIT වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොමැති හෝ වැරදි වාර්තාවක් ඉදිරිපත් කර ඇති ඕනෑම සේවායෝජකයකු සඳහා දණ්ඩන පනවනු ලැබේ.*

## 2024 මාර්තු මාසය සඳහා බදු ගෙවීම, 2024 අප්‍රේල් මස 15 හෝ එදිනට පෙර කරන්න.

| බදු වර්ගය | බදු වර්ගය සඳහා කේතය | කාල කේතය | ගෙවීම් ප්‍රභේදය |
|---|---|---|---|
| අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (APIT) | 03 | 24030 | S |

### ගෙවීම් පත්‍රිකා ලැබෙනතුරු බලා නොසිට

- නියමිත බදු මුදල මාර්ගගත බදු ගෙවීමේ පහසුකම (OTPP) මගින් ගෙවීමට කටයුතු කරන්න
  වැඩි විස්තර සඳහා www.ird.gov.lk දේශීය ආදායම් වෙබ් අඩවිය වෙත පිවිස 'බදු ගෙවීම් – මාර්ගගත බදු ගෙවීමේ පහසුකම (OTPP)' හි සඳහන් නිවේදනය බලන්න
- එසේම, APIT සඳහා ලංකා බැංකු ශාඛා මගින් ගෙවීම් කළ යුතු ය.
- DIN අංකයක් https://eservices.ird.gov.lk/Payment/PayingInSlip/Index මගින් ලබා ගත හැකිය.
- *බදු නොගෙවා සිටීම හෝ ප්‍රමාදවී ගෙවීම සඳහා පැනවෙන දඩ සහ පොලී කිසිදු විටක ඉවත් නොකරන බව හෝ අඩු නොකරන බව කාරුණිකව දැනුම් දෙමි.*

**දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්**